# අනුරාධපුර යුගයේ පැවති කෘෂිකාර්මික කටයුතු පිළිබඳ විමර්ශනයක්

ඉෂාරා සුරංජි පෙරේරා*

## සංක්ෂේපය

ගංගා නිම්න ආශ්‍රිත කරගනිමින් ව්‍යාප්ත වූ ජනාවාසකරණයත් සමග කෘෂිකර්මාන්තය රටේ ආර්ථික කටයුතු අතරින් ප්‍රමුඛ විය. මූලාශ්‍රයට අනුව අනුරාධපුර යුගයේ දී බහුතර ජනතාවගේ ජීවනෝපාය කෘෂිකර්මාන්තය වූ අතර රජයේ ආදායමින් වැඩි කොටස සපයා ගන්නා ලද්දේ කෘෂිකර්මාන්තයට අයත් බදු වලිනි. මේ ලිපිය මගින් විමර්ශනය කරනුයේ අනුරාධපුර යුගයේ පැවති කෘෂිකාර්මික කටයුතුයි. මෙහිදී සාහිත්‍යය හා අභිලේඛන ඇසුරින් තොරතුරු විමර්ශනය කිරීම සිදුවිය.

## හැඳින්වීම

රටේ බහුතරයකගේ ජීවනෝපාය වූ කෘෂිකර්මාන්ත කටයුතු පිළිබඳව විමර්ශනය කිරීමේදී මූලාශ්‍රයට අනුව ඉතා විශාල භූමි ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගත් බව පැහැදිලි වේ. මේ කෘෂිකර්මාන්ත කටයුතු ඉඩම් බුක්තිය, බදු ක්‍රමය හා වාරි මාර්ග සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පැවතුණ බව පෙනේ. අනුරාධපුර යුගයේ පැවති මේ කෘෂිකර්මාන්ත කටයුතු පහත අංශ යටතේ සාකච්ඡා කළ හැකිය.

- ගොවීන්
- වගා බිම්
- වගා කළ බෝග
- කන්න ක්‍රමය
- කෘෂි නිලධාරීන්
- කෘෂිකාර්මික නීති හා සම්ප්‍රදායන්

## ගොවීන්

අනුරාධපුර යුගයේ රටේ බහුතරයක ජනතාවගේ ජීවනෝපාය කෘෂිකර්මාන්තය වූ බවට මූලාශ්‍රමය සාධක ලැබෙතත් ඒ ක්ෂේත්‍රයේ නියැලුණු ගොවීන් පිළිබඳව සඳහන් කර ඇත්තේ අල්ප වශයෙනි. වී ගොවිතැන මෙරට විසූවන්ගේ ප්‍රධාන කර්මාන්තය බවට පත්ව තිබූ බවට මුල්ම සාධකය ලැබෙනුයේ මහාවංසයෙනි. ඒ පණ්ඩුල බ්‍රාහ්මණයා වෙතින් ශිල්ප හදාරා සමුගෙන යන පණ්ඩුකාභය කුමරාට පාලි නම් ක්ෂත්‍රිය කන්‍යාව මුණගැසුනේ ඇගේ පියා වූ ගිරිකණ්ඩශිව ගොයම් කපමින් සිටින ස්ථානයට ආහාර ගෙනයමින් සිටින අවස්ථාවේය *(මහාවංසය, 10:31)*. මහාවංසය මෙහිදී ගොවීන් හැඳින්වීමට යෙදුමක් භාවිත කර නොමැත. සාහිත්‍ය මූලාශ්‍රය අනුව ගොවීන් පිළිබඳව ලැබෙන සාධක අඩු වුව ද ශිලාලේඛන වල ඊට සාපේක්ෂව වැඩි තෙරතුරක් අන්තර්ගතව පවතී. ක්‍රි.ව. 4 වන සියවසට

---

* *තාවකාලික කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, suranjiperera89@gmail.com*

අයත් යැයි සැලකෙන පීලිකෙම පර්වත ලිපියේ "කසගනක" යන්නෙන් සඳහන් කර ඇත්තේ ගොවියෙකු බව සඳහන් වේ *(EPIGRAPHIA ZEYLANICA, Vol, VII, 108).* ඒ ලිපියට අනුව කසගනක යනු පාලියෙන් බිදී ආවක් ලෙසට අනුමාන කෙරේ.

IV මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ "හස්කරුවන් " යනුවෙන් ගොවීන් හඳුන්වා ඇත *(EZ, Vol, I, 87).* V වන කාශ්‍යප රජුගේ පඬුවස්නුවර ටැම් ලිපියට අනුව "කුඩිනට්" යනුවෙන් හඳුන්වා ඇත්තේ අඳ ගොවියන් බව සඳහන් වේ *(ඉන්දික, 2012, 80).*

**වගා බිම්**

මූලාශ්‍රය අනුව මේ යුගයේ පැවති වගා බිම් පහත පරිදි විය.

- කුඹුරු
- හේන්
- වතු

කුඹුරුඃ- මූලාශ්‍රය අනුව කුඹුරු හැඳින්වීම සඳහා විවිධ නාමයන් පැවති බව තහවුරු වේ. මහාවංසයට අනුව "කරිස" නමින් කුඹුරු හඳුන්වා ඇත.

"සො කරීසසතං පක්කං තදා ලාබෙති බත්තියො
තස්සධීතා රූපවතී පාලි නාමා' සි බත්තියා"

*(මහාවංසය,10:30)*

ගිරිකණ්ඩශිවගේ දියණිය වූ පාලි සිය පිරිවර සමග පියාට සහ පිරිසට ආහාර රැගෙන කෙතට ගිය බව මහාවංසයේ සඳහන් වීමෙන් ද තහවුරු වන්නේ ඒ යුගයේ කුඹුරු පැවති බවයි (මහාවංසය,10:31). මහාචූලික මහාතිස්ස රජු ද සහල් කෙතක් වැඩකර දනක් දුන් බව සඳහන් වීමෙන් තහවුරු වන්නේ ද කුඹුරු බැවති බවයි *(මහාවංසය,34:3).*

සාහිත්‍ය මූලාශ්‍රයේ පමණක් නොව ශිලාලේඛන වලද කුඹුරු හැඳින්වීම සඳහා විවිධ නාමයන් භාවිත කළ බවට සාධක ලැබේ. ශිලාලේඛන වලට අනුව,

- කෙත *(EZ, Vol, VII, 107).*
- කුම්බුර් *(EZ, Vol IV, 56) (EZ, Vol, I ,116).*
- කුඹුර *(EZ, Vol, IV ,114).*

IV මිහිඳු රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ කුඹුරු පිළිබඳව සඳහන් කිරීමේදී කළැලි කුම්බුර්, වියල් කුම්බුර් යන දෙපද හමුවෙයි *(EZ, Vol, I, 116)* රණවැල්ල මහතා සඳහන් කරන්නේ කළැලි කුම්බුර් යන්නෙන් මඩ කුඹුරු හඳුන්වා ඇති බවත් වියල් කුම්බුර් යන්නෙන් කැළෑ එළිපෙහෙළි කොට අලුතින් තනා ගැනුනු හෝ පුරන්ව තිබී නැවත සකස් කරගත් කුඹුරු හැඳින්වූ බවත්ය *(රණවැල්ල, 1984, 245).*

මූලාශ්‍රයගත තොරතුරු අනුව විවිධ විශාලත්වයෙන් වූ කුඹුරු ද පැවතිණ. පණ්ඩුකාභයගේ බෑණා වූ ගිරිකණ්ඩශිවට අක්කර 100 ක් පමණ වූ කුඹුරු යායක් තිබූ බව සඳහන් වේ *(මහාවංසය,10:29)*. ශිලාලේඛන වල ද විවිධ විශාලත්වයෙන් වූ කුඹුරු පැවති බවට සාධක හමුවෙයි.

- කතරගම පුවරු ලිපිය → අමණ කුබි → කුඹුරු අමුණක්
  *(EZ, Vol, VI II, 216)*
- අනුරාධපුර පුවරු ලිපිය → දෙකරිහ කුඹුරු → කුඹුරු කරිස දෙකක්
  *(EZ, Vol IV, 114)*
  වෙහෙරකෙම ශිලා ලිපිය → සතර කරිය කුඹුර → කුඹුරු කරිස සතරක්
  *(EZ, Vol IV, 143)*

විහාරයන්ට අයත්ව තිබූ කුඹුරු පිළිබඳව ද ශිලාලේඛනමය සාධක ඉදිරිපත් වන අතර තිසා වැවෙන් ජලය ලබාගෙන වගා කළ ඉසුරුමුණි විහාරයට අයත්ව තිබූ කිරිය එකසිය හතළිස් හතරක් හා එක් පයක් විශාලත්වයෙන් යුක්ත වූ කුඹුරක් පිළිබඳව අනාවරණය වේ. *(EZ, Vol I, 32)*

**කුඹුරු වල වගා කරන ලද ධාන්‍ය**

කුඹුරු වල ප්‍රධාන වශයෙන්ම වගා කරන ලද්දේ සහල්ය. මූලාශ්‍රයන්හි සහල් 'සාලි' නමින් හඳුන්වා ඇත. සහල් පිළිබඳ මූලාශ්‍රයගත සාධක ඉදිරිපත් කිරීමේදී විජය කුමරු ලක්දිවට ගොඩබට මුල් දිනයේ දී අනුභව කළේ කුවේණිය විසින් සපයන ලද සහලින් පිසගත් බතක් බව මහාවංසයේ සඳහන් වේ.

"හච්චා තෙ සාධයිත්වාන හත්තානි බ්‍යඤ්ජනානිච

රාජපුත්තං හොජයිත්වා සබ්බෙ වාපි අභුඤ්ජිසුං" *(මහාවංසය, 7:25)*

මේ සහල් විවිධ වර්ග වලට ද අයත් විය. හැල් වී නමින් වූ සහල් වර්ගයක් පිළිබඳව ද සාධක ලැබේ. දුටුගැමුණු රජ සමයේ දිවයිනේ සෑම ප්‍රදේශයකම ඇල් වී හෙවත් හැල් වී වගා කර තිබූ බව මූලාශ්‍රයේ සඳහන් වේ *(සද්ධර්මාලංකාරය, 1997, 629)*. දුටුගැමුණු රජුගේ පුත් උපන් දින දොළොස් වසක් ඉක්ම යන තුරු ලංකා භූමියේ සෑම ප්‍රදේශයකින් පාහේ ඇල් වී ලැබුණු හෙයින් ඒ අරුතින් සාලි කුමරු යන නම ලැබුණු බව මූලාශ්‍රයේ සඳහන් වේ *(සිහලවත්ථුව, 1959, 23)*. මහාචූලික මහාතිස්ස රජ දවස ද ඔහු හැල් කෙතක් වැඩකර මහ සඟ රුවනට දනක් පිරිනැමූ බව මහාවංසයේ සඳහන් වේ *(මහාවංසය,34:3)*.

"කත්වාන සාලිලවනං ලද්ධාය භාතියා තතො

පිණ්ඩපාතං මහාසුම්මථෙරස්සං'දා මහීපති " *(මහාවංසය, 34: 3)*

රසවාහිනියෙන් ද හැල් වී පිළිබඳව සාධක ලැබෙන අතර මහවැලි ගඟට උතුරු ප්‍රදේශයේ වාසය කළ චණ්ඩසූරිය නම් පුද්ගලයෙකුට සුවිසල් හැල් කෙත් යායක් තිබුණු බව සඳහන් වේ *(රසවාහිනිය, 2004, 48).*

කංගු නම් වූ සහල් වර්ගයක් පිළිබඳව ද සාධක ලැබේ. ගැමුණු කුමරු මලය රටට පළා යන අවස්ථාවේ කංගු පිරවූ ලබු කැටයක් වැපිරීම සඳහා කෙතට ගෙන යමින් සිටි ස්ත්‍රීයක් කංගු නැළියක් ගැමුණු කුමරුටද ලබා දුන් බව සඳහන් වේ *(සහසවත්ථුප්පකරණය, 1959, 112).* කංගු යනු තණ හාල් සඳහා භාවිත වූ තවත් නාමයක් බව බුද්ධදත්ත හිමියෝ සඳහන් කරති *(බුද්ධදත්ත හිමි, 1950, 139).*

සාහිත්‍යමය මූලාශ්‍රය හැරුණුකොට මේ සමයේ වගා කළ වී වර්ග පිළිබඳ ශිලාලේඛනමය සාධක ද ලැබේ. එප්පාවල පුවරු ලිපියේ එන "සසරපැඩි" යනු වී වර්ගයක් බව පරණවිතාන මහතා සඳහන් කරයි *(EZ, Vol III, 193).* සිහිනැටි යන්නෙන්ද වී වර්ගයක් පැවති බව IV වන මිහිඳු රජුගේ වෙස්සගිරි පුවරු ලිපියේ එන "සිහිනැටි වපුරනු මිස මුඟ් ඇටි නොවපුරනු  කොට් ඉසා" යන යෙදුමෙන් පැහැදිලි වේ *(EZ, Vol II, 193).*

**හේන් වගාව**

කුඹුරු වලට අමතරව අනුරාධපුර යුගයේ පැවති හේන් වගාව පිළිබඳවද සාධක හමුවේ.  මූලාශ්‍රවල "සෙණ" යනුවෙන් හඳුන්වා ඇත්තේ හේන් ය.පොළොන්නරු රාජ සභා ටැම් ලිපියේ "දෙසෙනක් හුලුපුපක්" යනුවෙන් ද *(EZ, Vol IV, 39)* මැදඋල්පොත ටැම් ලිපියේ එක් සෙණෙක් හුලු යනුවෙන් ද *(EZ, Vol IV, 55)* එන යෙදුම්හි සෙණ යනු හේන් ය.

**හේන් වල වගා කරන ලද ධාන්‍ය.**

මූලාශ්‍රගත සාධක වලට අනුව හේන්වල වගා කළ ධාන්‍ය වූයේ තල, මුං, උඳු, මාස, උළුහාල් ය. තල, හේන් ගොවිතැනින් නිපද වූ වැදගත් බෝගයක් විය. සාහිත්‍යමය හා ශිලාලේඛනමය සාධක වලට අනුව තල ආහාරයක් හා ඖෂධයක් ලෙස ද භාවිතයට ගෙන ඇති බව පෙනේ. මහාවංසයට අනුව දුටුගැමුණු රජු මහාථූපයේ පදනම වඩාත් ශක්තිමත් වීමට තල තෙල් යෙදූ බව සඳහන් වීම තුළින් පෙනී යන්නේ තල වගාව එකල සමාජයේ බෙහෙවින් පැතිර තිබූ බෝගයක් වූවා සේම ගොඩනැගිලි ඉදිකිරීමේ කර්මාන්තයේ දී සවි ශක්තිය රඳ පැවැත්මට ද තල තෙල් භාවිත කර ඇති බව ය.

" මනොසිලාය තිලතෙලසන්තිතාය තතොපරි
සත්තඞගුලං සජ්ජුපට්ටං සන්ථරෙසි රථෙසභො"      *(මහාවංසය, 29:12)*

භාතිකාභය රජ දවස ද රුජු මහාථූපය වටා තල තෙලින් පහන් දැල්වූ බව සඳහන් වීමෙන් පෙනී යන්නේ එකල තලතෙල් බෙහෙවින් ප්‍රචලිතව පැවතියා පමණක් නොව පොල්තෙල් වෙනුවට ආදේශක ද්‍රවයක් ලෙසද යොදාගත් බව ය.

"මධුකතෙලමහි තථා තිලතෙලෙ තථෙව ච

තථෙව පට්ටවට්ටීනං සුබහූහි සිබා හිච" *(මහාවංසය, 34:56)*

තල වගාව පැවති බවට ශිලා ලේඛනමය සාධක ද ලැබේ. එප්පාවල පුවරු ලිපියේ එන "තල දෙපැලක් ඉස" යන යෙදුමෙන් පෙනේ *(EZ, Vol III, 192-194).*

උඳු ද හේන් වල වගා කළ තවත් ධාන්‍යයක් විය. ගෝඨායිම්බර හා ඔහුගේ සොහොයුරන් කැළෑ එළිකොට හේනක් සකස්කර උඳු වැපිරූ බව මහාවංසයේ සඳහන් වේ.

"තෙ ගන්ත්වා මාසඛෙත්තාත්‍රං කොට්ටයිත්වා මහාවනං

තස්ස භාගං ඨාපෙත්වාන ගනත්වා තස්ස නිවෙදයුං" *(මහාවංසය,23:51)*

තෝනිගල ශිලා ලිපියේ එන "උඳු ඉස බයලි දස අමනක් ඉස" *(EZ, Vol, III, 177-178)* යන ශිලා ලේඛනමය සාධකය තුළින් තහවුරු වන්නේ ද අනුරාධපුර යුගයේ පැවති හේන් වගාව යටතේ උඳු වැපිරීමට ජනතාව උනන්දු වූ බව ය.

මාස ද හේන් වගාව යටතේ පැවති තවත් ධාන්‍යයකි. මාස, රාජමාස හා කාලමාස යනුවෙන් දෙවර්ගයක් වූ බව සඳහන් වේ. රසවාහිනියට අනුව ලංකාවේ දකුණු ප්‍රදේශයේ බ්‍රහ්මචෝල නම් ගම්මානයක් තිබූ අතර එහි ප්‍රධාන ධාන්‍ය වර්ගය වූයේ මාස යි *(රසවාහිනිය, 2004, 53)*

උළුහාල් වගා කළ හේන් ද පැවතිණ. මැදඋල්පොත ටැම් ලිපියේ "එක් සෙණක් හුලු පනාවැලි" යන්නෙන් උළුහාල් හේන් දක්වා ඇතැයි සඳහන් වේ *(EZ, Vol, IV, 55).*

මුං ද එකල සමාජයේ වැසියා අතර බෙහෙවින් ජනප්‍රිය වූ ආහාරයක් වූ බවත් ඒවා ද වගා කිරීමට වැසියා පෙළඹුන බවත් මූලාශ්‍රය අනුව පෙනේ. මුං 'බයලි' යන නාමයෙන් ද හැඳින් වූ බව "බයලි දස අමනක් ඉස" යන ශිලාලේඛනමය සාධක අනුව පෙනේ (*EZ, Vol III, 177-178).*

මීට අමතරව හේන් වල අලුපුහුල් ලබු වැනි එළවළු වර්ග ද වැවූ බව මූලාශ්‍රගත සාධක ලැබේ. අමණ්ඩගාමිණී අභය රජු තම රාජ්‍ය කාලයේ දී රාජධානියේ ආහාර සුලබ කිරීමේ මාර්ගයක් වශයෙන් කොමඩු වැනි එල වර්ග වැවීමට අනුබල දුන් බව මහාවංසයේ සඳහන් වේ.

"මංසකු මහණ්ඩකං නාම අමණ්ඩිය මහීපති

පත්තං පූරායිත්වාන කාරෙත්වා වත්‍ථුමබටං" *(මහාවංසය, 35:7)*

මාසාතං සකලෙ දීප කාරෙයි මනුජාධිපො

වල්ලීඵලානි සබ්බාති රොපාපෙත්වා තහිං තහිං" *(මහාවංසය, 35:6)*

**වතු වගාව**

කුඹුරු, හේන් වගාව හැරුණු කොට වතු වගාව ද අනුරාධපුර යුගයේ පැවති බවට මූලාශ්‍රගත සාධක ලැබේ. ශිලාලේඛන වල 'කෙත්වතු' යන නමින් වතු හඳුන්වා ඇත *(EZ, Vol I, 32)*. වතු වගාව යටතේ බුලත්, පුවක්, පොල්, උක් වැනි වගාවන් සිදු කළ බව පෙනී යයි.

බුලත් හා පුවක් සැපීම මෙකල ජනප්‍රියව පැවති නිසා බුලත් වගාව පැවති බව පෙනේ. කාවන්තිස්ස රජ දවස භික්ෂූන්ට දැහැත් පිළිගැන්වීමේ චාරිත්‍රය වූ නිසා එකල බුලත් වගාව පැතිර තිබූ බව පෙනේ *(සහසසවත්ථුව, 1999, 80)*. වසභ රජ දවස ද පුවක් හා හුණු එකතුව බුලත් සැපීම ප්‍රචලිතව පැවති නිසා බුලත් වගාව මේ යුගයේ ද පැවති බව පෙනේ

"ගච්ඡතො තෙන සහසා තම්බූලං චුණ්ණවජ්ජිතං

හත්‍ථමහි වසභස්සා'දාතං සාධු පරිරක්ඛිතුං" *(මහාවංසය, 35:62)*

"රාජාගෙහස්ස ද්වාරමහි තම්බූලං චුණ්ණවජ්ජිතං

සෙනාපති උදක්ඛිත්‍වා තං චුණ්ණත්‍ථං විසජ්ජයි" *(මහාවංසය,35:63)*

බුලත් මෙන්ම පුවක් වගාව ද මෙකල බැවති බවට සාහිත්‍යමය හා ශිලා ලේඛනමය සාධක ලැබේ *(මහාවංසය, 26:47) (EZ, Vol, III, 193)*.

පොල් වගාව ද මෙකල වතු වගාව යටතේ විය. IV මිහිඳු රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ "නැරල්" යනුවෙන් ද මිහින්තලේ ටැම් ලිපියේ "පුළුපත්" යනුවෙන් ද හඳුන්වා ඇත්තේ පොල් ය.මහාවංසයට අනුව දොළොස් වියේ සිටි ථෙරපුත්තාභය විසින් අගල් තිස් අටක් හා සොළොස් රියන් උසැති යගදාවකින් ගසා පොල් ගස් වල වූ පොල් බිම හෙලූ බව සඳහන් වේ.

"තාලානං නාළිකෙරානං ඛන්ධෙ ආහච්ච තාය සො

තෙ පාතයිත්‍වා තෙනෙව යොධො සො පාකටො අහු" *(මහාවංසය,23:59)*

උක් වගාව ද වතු වගාව යටතේ වූ බව මූලාශ්‍රය ඇසුරින් පෙනී යයි. වර්තමානයේ ද සීනි නිෂ්පාදනයට අයත් ප්‍රධානතම අමුද්‍රව්‍යය වන්නේ උක් ය. මූලාශ්‍රගත තොරතුරු වලට අනුව උක්වලින් හා එයින් ලබා ගන්නා පැණි වලින් හකුරු සහ වෙනත් රසකැවිලි තැනූ බවට සාධක හමුවේ. මහාචූලිකමහතිස්ස රජු පින් පිණිස තෙවසක්ම උක් කර්මාන්ත ශාලාවක කුලී වැඩ කරමින් එයින් උපයාගත් වැටුපෙන් උක් හකුරු මිලදීගෙන ඒවා භික්ෂූන් වහන්සේලාට පූජා කළ බව සඳහන් වේ *(මහාවංසය 34:5)*. III මිහිඳු රජු ද පාංශුකූලික භික්ෂූන් උදෙසා දිනපතා උක් පිරිනමන ලදැයි සඳහන් වේ. මේ සාධක වලට අනුව උක් කර්මාන්තය අනුරාධපුර යුගයේ යහමින් ක්‍රියාත්මක වූ බව පෙනීයයි. තිස්සමහාරාම ශිලාලිපියේ 'කිරිය නව දහසක' උක් වත්තක් පිළිබඳව සඳහන් වීමෙන් තහවුරු වන්නේ ද එකල උක් වගාව පැවති බව යි *(EZ, Vol, III, 124)*.

කපු වගාව ද මේ යුගයේ වගාවන් අතර විය. විජය ඇතුළු පිරිස මෙරටට පැමිණෙන අවස්ථාවේ කුවේණිය හිඳ ඇත්තේ කපු කටිමින් බව වංසකතාව සඳහන් කරයි *(මහාවංසය, 7:11).* එසේනම් විජය කුමරු පැමිණීමටත් පෙර මෙරට රෙදිපිළි නිෂ්පාදනය කළ බව අනුමාන කළ හැකිය. අනුරාධපුරයේ රජකම් කළ මහානාග රජු ජම්බලා නම් පේසකාරගාමය නැතහොත් "ජම්බලා" නමින් හැඳින්වූ රෙදිපිළි කර්මාන්තයේ බහුලව නිරත වූ ග්‍රාමය මහා විහාරයේ භික්ෂූන් සඳහා සිවුරු හා අනෙකුත් වස්ත්‍ර තනා ගැනීම උදෙසාම ප්‍රවේණි කොට දුන් බව මහාවංසයේ සඳහන්ය*(මහාවංසය, 40:96).* අනුරාධපුර යුගයේ දී පේෂ කර්මාන්තය පැවති බවට සාධක ලැබෙන හෙයින් මේ යුගයේ කපු වගාව පැවති බව මූලාශ්‍රය ඇසුරින් පෙන්වාදිය හැකිය.

ආහාර රසවත් කර ගැනීමට මෙන්ම ආහාර කල් තබා ගැනීමට ද කුළු බඩු අත්‍යවශ්‍ය විය. මෙනිසාම කුළු බඩු වර්ග ද ගෙවතු වගාව යටතේ වගා කිරීමට මෙකල වැසියා පුරුදුව සිටි බව මූලාශ්‍රය ඇසුරින් පෙනී යයි. ගම්මිරිස්, ඉඟුරු, සුදු ලූණු, මිරිස්, කහ, දුරු වැනි කුළු බඩු ඒ යටතේ විය. මහාවංසයට අනුව දුටුගැමුණු රජතුමා මිරිසවැටි දාගැබ ඉදිකරන්නේ මහ සඟරුවනට මිරිස් මාලුවෙන් කොටස් නොදී අනුභව කළ වරදටය *(මහාවංසය,26:16-17).* කහ ද වැදගත් කුළු බඩුවක් වූ බව මූලාශ්‍රය ඇසුරින් පෙනී යයි.

ඉඟුරු වැවීම ද මලය රට ආශ්‍රිත ප්‍රදේශයන්හි පැවති බව මූලාශ්‍රය සඳහන් කරයි. *(මහාවංසය, 28:21).* මේ අනුව පෙනී යන්නේ අද මෙන්ම එකල ද ආහාර රසගැන්වීමට මෙන්ම වෙළඳාම සඳහා ද කුළු බඩු වගා කිරීමට ජනයා පෙළඹුන බව යි.

මීට අමතරව කොස්, දොඩම්, කෙසෙල් වැනි බෝග වර්ග පිළිබඳව ද ශිලාලේඛන වල සඳහන් වීම තුළින් මෙන්ම *(EZ, Vol I, 113-120)* ඇතැම් ශිලාලේඛන වල තල්, මී සියඹලා වැනි ගස් වර්ග නොකැපිය යුතු බව දක්වා තිබීමෙන් ද පෙනී යන්නේ ඇතැම් විට මේවා ද සුළු වශයෙන් හෝ ගෙවතු වල වගා කරන්නට ඇති බව යි *(EZ, Vol II, 56).*

**කන්න ක්‍රමය.**

කෘෂිකාර්මික කටයුතු පිළිබඳව සඳහන් කිරිමේ දී කන්න ක්‍රමය ද දැක්විය හැකිය. අනුරාධපුර යුගයේ පැවති කන්න ක්‍රමය පිළිබඳව සඳහන් කිරීමේදී වැදගත්ම මූලාශ්‍රය වන්නේ ශිලාලේඛනයි. ශිලාලේඛන වල එන "හස" හා "කරල" යන යෙදුමෙන් ශෂ්‍ය වාරය හඳුන්වා ඇත *(EZ, Vol III, 177,185).* තෝනිගල ශිලා ලිපියට අනුව එදා කන්න තුනක් විය. එනම්,

- පිටදඩහස
- අකලහස
- මදෙහස යනුවෙනි *(EZ, Vol, III, 177,185).*

පිටදඩහස යනුවෙන් හඳුන්වා ඇත්තේ මහ කන්නය යි. මහ කන්නය ප්‍රධාන ගොවිතැන් වාරය වූ අතර ඊසානදිග මෝසම් සුළඟින් ලැබෙන වර්ෂා දියෙන් ගොවිතැන් කටයුතු සිදු කළේය. අවුරුද්දේ ප්‍රධාන අස්වැන්න ලැබෙන වාරය මෙයම විය.

අකලහස යනුවෙන් හඳුන්වා ඇත්තේ යල කන්නය යි. යල කන්නයේදී නිරිතදිග මෝසම් සුළඟින් ලැබෙන වර්ෂා දියෙන් ගොවිතැන් කටයුතු සිදු කළේය. යල මහ කන්නයට වගා කිරීම එදා පමණක් නොව අද ද කෘෂිකාර්මික කටයුතු වල නියැලෙන ප්‍රදේශවල දැකිය හැකි ය.

මදෙහස යනු මැද කන්නය යි. මැද යනුවෙන් හඳුන්වා ඇත්තේ යල මහ ප්‍රධාන කන්න දෙකට මැදිව ගොවිතැන් කටයුතු වල යෙදුණ නිසාය. මෙය එතරම්ව වැදගත්ව සලකා නොමැති අතර වැව් වල ජලය අඩු වූ අවස්ථාවන් හි මැද කන්නයේ වගා කටයුතු අතහැර දමන්නට ඇති බව අනුමාන කළ හැකි ය.

මීට අමතරව ශෂ්‍ය වාර හැඳින්වීමට 'කරල' යන යෙදුම ද යොදා ගත් බව වැල්මිල්ල ශිලා ලිපියේ එන "දෙකරලින් බදු දෙසිය පනස් කළඳක්" යන යෙදුමෙන් පෙනේ *(EZ, Vol III, 301,302)*.

**කෘෂි නිලධාරීන්.**

අනුරාධපුර යුගයේ කෘෂිකර්මාන්ත කටයුතු මෙලෙස ව්‍යාප්තව පැවති නිසා කුඹුරු හා ගොඩ ඉඩම් වගා කරවීමටත් පෞද්ගලික ඉඩම් අයිති ඉඩම් හිමියන්ගෙන් ගොවිතැන් බදු අයකර ගැනීමටත් රජය සතු ඉඩම් රජු විසින් පවරා දෙන අවස්ථාවන්හි ඒවා පිළිබඳව වාර්තා තැබීම් ආදී කටයුතු වලට නිලධාරි පිරිසක් ඒ යුගයේ ද සිටින්නට ඇතැයි මූලාශ්‍රගත තොරතුරු අනුව අනුමාන කළ හැකිය. ශිලාලේඛන වල මෙකල සිටි කෘෂිකාර්මික නිලධාරීන් හැඳින් වූ නාමයන් වූයේ,

- වෙලැයුත් සම්දරුවන් *(EZ, Vol II, 29)*
- වෙල්කැමි *(EZ, Vol II, 115)*
- වෙල්බැඳි *(EZ, Vol I, 203)*
- වෙල්වැස්සන් *(EZ, Vol I, 203,Vol,IV, 54)*
- කැරැවැදෑරුමන් හා කැරැපැකැරුමන් *(EZ, Vol III, 193)*

V කාශ්‍යප රජුගේ මැදිරිගිරි ටැම් ලිපියේ සඳහන් වන "වෙලැයුත් සම්දරුවන් ගමට් වැදැ රට් නොගන්නා ඉසා" යන පාඨයෙන් කෘෂිකාර්මික නිලධාරින් පිරිසක් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකිවේ *(EZ, Vol II, 29)*. ටැම් ලිපියේ එන කරුණු වලට අනුව මේ නිලධාරීන් ගොවීන්ගෙන් බදු අය කර ගැනීමේ කාර්යයේ නිරත වී ඇත.

බිලිබැව හා මැදිරිගිරිය යන ටැම් ලිපි වල ද "වෙලැයුත් පස්දෙනා" යනුවෙන් කෘෂිකාර්මික නිලධාරින් පස්දෙනෙකු ගැන සඳහන් වෙයි *(EZ, Vol II, 33)*. මොවුන්

කෘෂිකාර්මික කම්ටුවක් ලෙස ක්‍රියා කරන්නට ඇතැයි අනුමාන කරන අතර මේ නිලධාරීන් ද ගොවීන්ගෙන් බදු අය කර ගැනීමේ කාර්යයේ නිරත වී ඇත.

ඇතැම් ශිලා ලිපි වල වෙල්කැමි නමින් ද කෘෂිකාර්මික කටයුතු වලට සම්බන්ධ නිලධාරී පිරිසක් හඳුන්වා ඇත *(EZ, Vol I, 203)*. ශිලාලේඛනමය සාධක වලට අනුව වෙල්කැමියන් කුඹුරු වැඩ පරීක්ෂා කරන්නන් ලෙසට සේවය කළ පිරිසක් බව අනුමාන කළ හැකි ය.

වෙල්බැඳි යන්නෙන් හඳුන්වා ඇත්තේ ද කෘෂිකාර්මික නිලධාරීන් පිරිසකි *(EZ, Vol I, 203)*. මොවුන් ද කුඹුරු ගොවිතැන හා සම්බන්ධ කටයුතු වල දී රජයට සහයෝගය දුන් පිරිසක් විය.

වෙල්වැස්සන් හා වෙල්වදාරන්නන් නමින් ද කෘෂිකාර්මික නිලධාරීන් පිරිසක් වූ බව ශිලාලේඛනමය සාධක සපයයි *(EZ, Vol, I, 195, Vol, IV, 54)*. මෙයින් වෙල්වැස්සන් යනුවෙන් හඳුන්වා ඇත්තේ රජයේ ඉඩම් වගා කළ ගොවියන් ද නොඑසේනම් කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධව සිටි සුළු නිලධාරීන් පිරිසක් ද යන්න නිශ්චිතවම සඳහන් නොවන අතර වෙල්වදාරන්නන් යනු පසු කලෙක විදානේවරුන් ලෙස හඳුන්වනු ලැබූ නිලධාරීන්ට සමාන පිරිසක් වූ බවට සඳහන් වේ*(ඉන්දික, 2012, 85)*.

මීට අමතරව කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ කැරැවැදැරුමන් හා කැරැපැකැරුමන් යනුවෙන් නිලධාරීන් දෙපිරිසක් ගැන සඳහන් වේ *(EZ, Vol V, 136)*. පරණවිතාන මහතාගේ මතයට අනු ව මොවුන් ඉඩම් පරීක්ෂකවරුන් හා බදු ඉඩම් තක්සේරු කළ නිලධාරීන් ය.

IV මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි කොටරැකිනා නම් නිලධාරියෙකු පිළිබඳව සඳහන් වේ *(EZ, Vol, I, 188)*. කොටරැකි යනු රජයට අයවිය යුතු ධාන්‍ය මැන භාරගැනීමට සිටි නිලධාරීන් පිරිසක් ලෙසට අනුමාන කරයි.

**කෘෂිකාර්මික නීති හා සම්ප්‍රදායන්**

අනුරාධපුර යුගයේ කෘෂිකර්මාන්ත කටයුතු මෙලෙස ව්‍යාප්තව පවතිද්දී ඒ කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලව කරගෙනයෑම සඳහා නීති පනවා තිබූ බවට ශිලා ලේඛනමය සාධක හමුවේ. ශිලා ලේඛනමය සාධක වලට අනුව ඉඩම් වල වගා කටයුතු සිදුකිරීමේ දී වගා කළ යුතු බෝග වර්ග මොනවාද යන්න නීති පනවා තිබුණි. IV මිහිඳු රජුගේ වෙස්සගිරි ශිලා ලිපියට අනුව වෙස්සගිරි විහාරයට අයත් කුඹුරු යායේ වගා කිරීමට නියමව තිබුණේ 'සිහිනැටි' නම් වූ වී වර්ගය යි *(EZ, Vol I, 32)*. රජය මගින් වගා කළ යුතු බෝග වර්ග මොනවාද යන්න නීති පැනවීම තුළින් පෙනීයන්නේ වගා කටයුතු එක්තරා සැලැස්මක් අනුව සිදු කළ බවය.

ශිලා ලේඛනමය සාධක අනුව වගා කටයුතු නොකෙරෙන ඉඩම් රජයට පවරා ගැනීමේ නීතියක් වූ බව ද පෙනී යයි. IV මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියට අනුව ඒ ඉඩම් වගා නොකරන්නේ නම් නැවත රජයට පවරා ගැනීමේ හැකියාව පවතින බව සඳහන් කර ඇත *(EZ, Vol I, 87).*

ගොවීන්ගෙන් සිදුවන යම් යම් අතපසුවීම් හමුවේ බදු අය කළ අවස්ථා ගැන ද ශිලාලේඛනමය සාධක ඉදිරිපත් වේ. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියට අනුව කුඹුරු ජලයෙන් යටවීම සම්බන්ධ වරදකට අක දෙකක දඩයක් නියම විය *(EZ, Vol V, 136).* සී සෑම සම්බන්ධ වරදකට "සිවු වරදට් කළන්දක් ගන්නා කොට් ඉසා" යන්නෙන් කළඳක දඩයක් නියම විය *(EZ, Vol, V, 136-141).* ප්‍රමාද වී සී සෑමේ වරදට "ලස වැසි වු වරදට් දඩ පස් කළන්දක් ගන්නා කොට් ඉසා" යන්නෙන් කළන් පහක දඩයක් නියම විය.

කෘෂිකාර්මික කටයුතු වල නියලුණු පුද්ගලයන් ආරක්ෂා කර ගැනීම උදෙසා ද පැනවූ නීතිරීති විය. II උදය රජුගේ පඬුවස්නුවර ටැම් ලිපියට අනුව "මෙ ගැමැ සී කස්නට් ආනට් අනියා නොකරනු ඉස" යනුවෙන් ගමෙහි සී සෑමට පැමිණි අයට බාධා නොකළ යුතු බවට දක්වා තිබුණි *(EZ, Vol VI, 115).* අන්‍යෝන්‍ය සහයෝගයෙන් වැඩ කටයුතු සිදු කළ ආකාරය ද මෙයින් පැහැදිලි වෙයි.

ඇතැම් ශිලාලේඛන වලට අනුව ඵල දරණ ගස් වර්ග නොකැපිය යුතු බවට පැනවූ නීතිරීති ද පැවති බව පෙනේ. මිහිනිතලේ ටැම් ලිපියට අනුව "සෑ ගිරි ගල් උඩ තලන් පුළුපන් මීවන් සීනිම්බලන් නොකපනු ඉසා කැපුයු කම්තැන් ගෙනැ දඩ් ගන්නා ඉසා" යනුවෙන් තල්, පොල්, මී, සියඹලා යන ගස් වර්ග නොකැපිය යුතු බවත් එම වරද සිදු කළහොත් දඩ නියම කළ බවත් සඳහන් වේ *(EZ, Vol, V, 322).* මෙවැනි නීතියක් ක්‍රියාත්මක කරන්නට ඇත්තේ මේ ගස් වලින් ඒ යුගයේදී නිපදවා ගත් නිෂ්පාදන වල වූ වැදගත්කම මෙන්ම ඒ ගස් වල පැවති වටිනාකම නිසා වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

**නිගමනය**

අනුරාධපුර යුගයේ දී කෘෂිකාර්මික කටයුතු වලට ප්‍රමුඛත්වය හිමි වූ නිසාම බහුතර ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ද කෘෂිකර්මාන්තය යි. කුඹුරු වගාව, හේන් වගාව. වතු වගාව වශයෙන් ප්‍රධාන ප්‍රභේද තුනක් යටතේ වගා කටයුතු සිදු කළ අතර වී, උඳු, මුං, තල, උළුහාල්, පොල්, පුවක්, බුලත්, උක් යනාදිය ඒවායේ වගාකරන ලදී. රටේ භූමි ප්‍රමාණයෙන් විශාල පෙදෙසක් කෘෂිකාර්මික කටයුතු සඳහා වෙන් කර තිබූ බවත් ප්‍රධාන කන්න දෙකක් යටතේ ඒවායේ වගා කටයුතු සිදු කළ බවත් ඒවා විධිමත්ව පත්වාගෙන යාමට කෘෂිකාර්මික නිලධාරීන් මෙන්ම කෘෂිකාර්මික නීති රීති ද පනවා තිබූ බවත් වගා කටයුතු නිශ්චිත සැලැස්මක් යටතේ සිදු කළ බවත් අනුරාධපුර යුගයේ පැවති කෘෂිකාර්මික කටයුතු පිළිබඳව ඉදිරිපත් වන ප්‍රාථමික මූලාශ්‍රගත තොරතුරු ඇසුරින් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍රය

*මහාවංසය* (1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), ඇම්.ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.

*රසවාහිනිය* (2004), ගුණරත්න, එල්. (සංස්.), රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

*සද්ධර්මාලංකාරය* (1997), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*සහස්සවත්ථුව* (1999), පියරතන හිමි, වෑගම (සංස්.), ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*සිහලවත්ථුව* (1957) බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.

*සිංහලථූපවංසය* (2005) කරුණාතිලක, ඩබ්.එස්. (සංස්.), ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*EPIGRAPHIA ZEYLANICA-Vol I* (1912), Wickramasinghe, Don Martino, De Zilva (ed.) Oxford University Press, London.

*EPIGRAPHIA ZEYLANICA-Vol II* (1928), Wickramasinghe, Don Martino, De Zilva (ed.) Oxford University press, London.

*EPIGRAPHIA ZEYLANICA Vol III* (1933), Wickramasinghe, Don Martino, De Zilva (ed.) Oxford University press, London.

*EPIGRAPHIA ZEYLANICA Vol IV* (1943), Paranavitana S. (ed.) Oxford University press, London.

ඉන්දික, අමිල (2012), *අනුරාධපුර යුගයේ සමාජ ක්‍රමය*, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රණවැල්ල, සිරිමල් (1984), "පුරාතන අර්ථ ක්‍රමය", *මහවැලි වංශය I*, ඒකනායක ඩී.එම්.ජී. (සංස්.), මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, කොළඹ.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති (2005), *රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි*, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.